*සැ. යු.-* (i) 2021.08.06 දින අංක 2240 දරන *ගැසට් පත්‍රයේ* III, IV(අ) සහ IV(ආ) කොටස් පළ නොවීය.
(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2021 වර්ෂය සඳහා බදුල්ල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,241 - 2021 අගෝස්තු මස 13 වැනි සිකුරාදා - 2021.08.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1708 |

*සැ. යු.* - (i) ඛනිජ තෙල් සම්පත් පනත් කෙටුම්පත 2021 ජූලි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) සාමය, අධ්‍යාපනය, බලගැන්වීම සහ සංවර්ධනය උදෙසා වූ ක්‍රීඩා ආයතනය (SPEED) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 ජූලි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 සැප්තැම්බර් මස 03 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 අගෝස්තු මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1705 - B 82257— 5,403 (2021/08)
B-1

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය ඃ**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය

### ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත්කර ගැනීම - 2021/2022

මොරටුව විශ්වවිද්‍යාලයට අයත් තාක්ෂණික ආයතනය මගින් පවත්වනු ලබන තුන් අවුරුදු පූර්ණ කාලීන ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම පිණිස සුදුසුකම්ලත් අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව දියගම, හෝමාගම පිහිටි මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය තුළ පැවැත්වෙනු ඇත.

1. *සාමාන්‍ය* :

ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව දෑ අවුරුදු අධ්‍යයන හා එක් අවුරුදු ප්‍රායෝගික යන්ත්‍රාගාර පුහුණුවකින් ද සමන්විත වේ. පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ. මෙම පාඨමාලාවේ දී පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන් හැදෑරීමට අවස්ථාව ලැබේ. :-

(*අ*) නාවුක අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩය (*Set* 1)

(i) නාවුක ඉංජිනේරු තාක්ෂණය
(ii) නෞකා චලන අධ්‍යයන හා තාක්ෂණය

(*ආ*) අනිකුත් අධ්‍යයන ක්ෂේත්‍රයන් (*Set* 2)

(i) රසායන ඉංජිනේරු තාක්ෂණය
(ii) සිවිල් ඉංජිනේරු තාක්ෂණය
(iii) විදුලි ඉංජිනේරු තාක්ෂණය
(iv) ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය
(v) තොරතුරු තාක්ෂණය
(vi) යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය
(vii) පොලිමර් තාක්ෂණය
(viii) පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණය

2. *යෝග්‍යතාවය* :

2.1 *වයස* :

(*අ*) 2020.12.31 වැනි දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 24 ට වැඩි නොවිය යුතු ය.

(*ආ*) නෞකා චලන අධ්‍යයන තාක්ෂණය හා නාවුක ඉංජිනේරු තාක්ෂණය යන පාඨමාලාවන් හැදෑරීමට අපේක්ෂකයන් තෝරා ගැනීමේ දී 2020.12.31 වැනි දිනට වයස අවුරුදු 20ට අඩු අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ. එම පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීමේ දී විශේෂ වෛද්‍ය පරීක්ෂණයකට හා සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිට ඉන් සමත්විය යුතු වේ.

(*ඇ*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති ඕනෑම විශ්වවිද්‍යාලයක (විවෘත විශ්වවිද්‍යාලය හැර) හෝ උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් හා වෙනත් පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

2.2 *අධ්‍යාපන සුදුසුකම්* :

(*අ*) 1. අයදුම්කරුවන් ශ්‍රී ලංකා විභාග කොමසාරිස් ජනරාල් විසින් 2018, 2019 හෝ 2020 වසරේ පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී එකවර පහත සඳහන් විෂයයන්ගෙන් 03 ක් සමත්විය යුතු ය :

(i) භෞතික විද්‍යාව
(ii) රසායන විද්‍යාව
(iii) සංයුක්ත ගණිතය
(iv) උසස් ගණිතය

(ආ) ''නෞකා චලන අධ්‍යයන තාක්‍ෂණය'' හා ''නාවුක ඉංජිනේරු තාක්‍ෂණය'' යන පාඨමාලාවන් සඳහා අයදුම් කිරීමට අපේක්ෂිත අයදුම්කරුවන් හට අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන (C) සාමාර්ථයක් තිබීම අනිවාර්යය වේ.

3. *තෝරාගැනීමේ පදනම/ක්‍රියාපරිපාටිය :*

3.1 *පාඨමාලාවට ඇතුළත් කරගැනීම :*

ශිෂ්‍යයන් තෝරාගැනීම අ. පො. ස. (උ. පෙළ) විභාගයේ ප්‍රතිඵල හා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්‍ෂණික ආයතනය මගින් පැවැත්වෙන යෝග්‍යතා පරීක්‍ෂණයේ සාමාර්ථය මත සිදුවේ.

යෝග්‍යතා පරීක්‍ෂණය සමත් වූ ශිෂ්‍යයන් අතරින් අ. පො. ස. (උ. පෙළ) විභාග ලකුණුවල කුසලතාවය මත (Z ලකුණු මත) සිසුන් තෝරාගනු ලැබේ. 40% ක් අ.පො.ස. (උ. පෙළ) විභාගයේ කුසලතාවය මත හා 60%ක් දිස්ත්‍රික් පදනම මත ශිෂ්‍යයන් තෝරාගැනීම සිදුවේ.

3.2 *අධ්‍යයන ක්‍ෂේත්‍රය :*

යෝග්‍යතා පරීක්‍ෂණයේ ලකුණු හා අයදුම්කරුගේ එක් එක් ක්‍ෂේත්‍රය සඳහා දක්වන කැමැත්තේ අනුපිළිවෙල, අධ්‍යයන ක්‍ෂේත්‍රය තෝරා ගැනීමේ දී සැළකිල්ලට භාජනය කරනු ලැබේ.

4. *අයදුම් කිරීමේ පිළිවෙල :*

4.1 *අයදුම්පත් පෝරම :*

(i) පහත සඳහන් අන්තර්ජාල වෙබ් අඩවියෙහි සඳහන් කර ඇති මාර්ගගත අයදුම්පත්‍රය (online application) හරහා අයදුම්කරුවන් පළමුව සිය අයදුම්පත මාර්ගගත ව ඉදිරිපත් කළ යුතුය.

**http ://www.itum.mrt.ac.lk**

(ii) මාර්ගගත අයදුම්පත්‍රය (online application) ඉදිරිපත් කිරීමෙන් පසු අයදුම්කරුවන් ස්වයංක්‍රීයව ජනනය වන මාර්ගගත අයදුම්පත්‍රයේ මුද්‍රිත පිටපත බාගත කර ගත යුතුය.

(iii) බාගත කළ මුද්‍රිත පිටපතේ අන්තර්ගතය අයදුම්පතෙහි දක්වා ඇති පරිදි සහතික කළ යුතු අතර (අයදුම්පතේ 03 සහ 05 යන ඡේද බලන්න). අ. පො. ස. (උ.පෙළ) සහතිකවල සහතික කළ පිටපත් ද අයදුම්පතෙහි මුද්‍රිත පිටපත සමඟ එවීම අවශ්‍ය වේ.

(iv) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි මුද්‍රිත පිටපත බහාලන ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරේ ''**ජාතික තාක්‍ෂණ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ඇතුළත් වීම - 2021/2022**'' යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

(v) මාර්ගගත අයදුම්පත්‍රය (online application) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර යොමු කළ යුතු අතරම අයදුම්පතෙහි මුද්‍රිත පිටපත ''**සහකාර ලේඛකාධිකාරී, අධ්‍යයන හා ශිෂ්‍ය කටයුතු අංශය, මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්‍ෂණික ආයතනය, දියගම, හෝමාගම**'' යන ලිපිනයට අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර එවිය යුතුය.

(vi) තම ලිපිනය ලියන ලද රු. 45 ක් වටිනා මුද්දර අලවන ලද 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් ද අයදුම්පත සමඟ එවිය යුතුය.

*වැදගත් :*

සෑම අයදුම්කරුවෙකුම නියමිත දිනට පෙර මාර්ගගත අයදුම්පත්‍රය (online application) අයදුම්පතෙහි මුද්‍රිත පිටපත යන දෙකම ඉදිරිපත් කළ යුතු බව කරුණාවෙන් සලකන්න. මාර්ගගත අයදුම්පත්‍රය (online application) සහ අයදුම්පතෙහි මුද්‍රිත පිටපත ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ අයදුම්කරුවන්ගේ අයදුම්පත් වැඩිදුර කටයුතු සඳහා සලකා බලනු නොලැබේ.

4.2 *අධ්‍යයන ක්‍ෂේත්‍රයන් තෝරා ගැනීම :*

(i) මෙම පාඨමාලාව අධ්‍යයන ක්‍ෂේත්‍ර කාණ්ඩ දෙකකින් සමන්විත වේ.

(ii) නාවික අධ්‍යයන ක්‍ෂේත්‍ර කාණ්ඩය (SET 1) හෝ අනිකුත් අධ්‍යයන ක්‍ෂේත්‍ර කාණ්ඩය (SET 2) හෝ ක්‍ෂේත්‍ර කාණ්ඩයන් දෙකම සඳහා ඉල්ලුම් කළ හැක. ක්‍ෂේත්‍ර කාණ්ඩයන් දෙකම සඳහා අයදුම්කරන්නේ නම් ප්‍රමුඛතාවය සඳහන් කළ යුතුය.

(iii) නාවික අධ්‍යයන ක්‍ෂේත්‍ර කාණ්ඩයේ දී, එනම් නාවුක ඉංජිනේරු තාක්‍ෂණය සහ නෞකා චලන අධ්‍යයන තාක්‍ෂණය (SET 1) සඳහා ප්‍රමුඛතාවය සඳහන් කිරීමේ දී වඩාත් කැමති ක්‍ෂේත්‍රය 01 ලෙස ද අනෙක් ක්‍ෂේත්‍රය 02 ලෙස ද සඳහන් කළ යුතුය.

(iv) අනිකුත් ක්‍ෂේත්‍ර කාණ්ඩය (SET 2) සඳහා ප්‍රමුඛතාවය 1, 2, 3, 4, 5, 6, 7, 8 සඳහන් කළ යුතු අතර වඩාත් කැමති ක්‍ෂේත්‍රය 01 ලෙස ද, ඊළඟ ක්‍ෂේත්‍රය 02 ලෙස ද අන්තිම ක්‍ෂේත්‍රය 08 ලෙස ද සඳහන් කළ යුතුය.

5. (i) *ඉල්ලුම් පත්‍ර ගාස්තු :*

ඉල්ලුම් පත්‍ර ගාස්තු වශයෙන් එක් ක්‍ෂේත්‍ර කාණ්ඩයක් සඳහා රු. 800.00 (අටසියයක්) හෝ ක්‍ෂේත්‍ර කාණ්ඩයන් දෙකම සඳහා නම් රු. 1000.00 (දාහක්) ගෙවිය යුතු අතර, එම ගෙවීම ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් "**මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්‍ෂණික ආයතනය - ලංකා බැංකුවේ හෝමාගම ශාඛාවේ ගිණුම් අංක 0000308280**" දරන ගිණුමට බැර වන සේ ගෙවිය යුතුය. මෙම අයදුම්පත් ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

(ii) මුදල් ගෙවූ රිසිට්පතෙහි ස්කෑන් කළ පිටපතක් මාර්ගගත අයදුම්පත්‍රය (online application) සමග යොමු කළ යුතු අතර රිසිට්පතෙහි මුල් පිටපත සමග අයදුම්පතෙහි මුද්‍රිත පිටපත එවිය යුතුය.

(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2021.09.17 වැනි දින වේ.

6. *යෝග්‍යතා පරීක්ෂණය හා ඉංග්‍රීසි භාෂා ප්‍රවීනතා පරීක්ෂණය* :

අයදුම්කරුවන් විසින් අ. පො. ස. (උ. පෙළ) විභාගයේ ලබාගත් ප්‍රතිඵල, කුසලතා පදනම මත හා එක් එක් දිස්ත්‍රික්කයට අදාළ ලසු කළ සිසුන් ප්‍රමාණය මත, මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය හා ඉංග්‍රිසි භාෂා ප්‍රවීනතා පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

ඉංග්‍රීසි භාෂා ප්‍රවීනතා පරීක්ෂණයට අදළ අධ්‍යයන ආධාරක සටහන් **http://www.itum.mrt.ac.lk** වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකිය.

7. *පාඨමාලාව සඳහා ලියාපදිංචි කිරීම* :

(i) යම් පාඨමාලාවක් සඳහා තෝරා ගන්නා ලද අපේක්ෂකයන්, පාඨමාලාව සඳහා ලියාපදිංචි කරනු ලබන දින, පහත සඳහන් සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය :

- අ. පො. ස. (උ. පෙළ) සහතිකය
- අ. පො. ස. (උ. පෙළ) Z ලකුණු සඳහන් සහතිකය
- පාසල් හැරයාමේ සහතිකය
- උප්පැන්න සහතිකය
- සහතිකපත්වල හා අදාළ ලියකියවිලිවල නමෙහි යම් වෙනස්කම් ඇත්නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක්.

8. *ඉතා වැදගත්* :

(i) ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ලියාපදිංචි වන කිසිම අපේක්ෂකයකු, එම පාඨමාලාවේ කාලසීමාව තුළ දී, මෙම විශ්වවිද්‍යාලයේ වෙනත් පාඨමාලාවක් හෝ ශ්‍රී ලංකාවේ පිහිටා ඇති අන් කිසිම විශ්වවිද්‍යාලයක පාඨමාලාවක් (විවෘත විශ්වවිද්‍යාලය හැර) හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක පාඨමාලාවක් හැදෑරීමට සුදුසුකම් නොලබයි.

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති කිසිම විශ්වවිද්‍යාලයක (විවෘත විශ්වවිද්‍යාලය හැර) හෝ උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

(iii) අයදුම්පත්‍රයේ සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි විය යුතු අතර යම් ලෙසකින් තොරතුරු අසත්‍ය බව හෙලිවුවහොත් ඒ සම්බන්ධව ආයතනය විසින් ගන්නා ඕනෑම තීරණයකට අයදුම්කරු එකඟ විය යුතුය.

අධ්‍යක්ෂ,
මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය.

මොරටුව විශ්වවිද්‍යාලය,
මොරටුව.

08-138

---

## සංශෝධනය කිරීමයි

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2018(2021)**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2231 හා 2021.06.04 දිනැති *ගැසට්* පත්‍රයෙන් ප්‍රසිද්ධියට පත්කර ඇති ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2018 (2021) බඳවා ගැනීමේ නිවේදනය සඳහා පහත සංශෝධනයන් ඇතුළත් කරනු ලබන අතර, එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

| *අනු. අංකය* | *පුරප්පාඩු වූ තනතුරු අයත් දෙපාර්තමේන්තුව* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *සංකේත අංකය* |
|---|---|---|---|---|
| 03 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ) | 06 | 04 |
| 04 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | නියෝජ්‍ය/සහකාර වන සංරක්ෂක (වන කළමනාකරණ) | 08 | 05 |

| අනු. අංකය | පුරප්පාඩු වූ තනතුරු අයත් දෙපාර්තමේන්තුව | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | සංකේත අංකය |
|---|---|---|---|---|
| | | නියෝජ්‍ය/සහකාර වන සංරක්ෂක (අධ්‍යාපන) | 02 | 06 |
| | | නියෝජ්‍ය/සහකාර වන සංරක්ෂක (පර්යේෂණ) | 03 | 07 |
| 05 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | සහකාර පස් රසඥ | 03 | 08 |
| | | ජල විද්‍යා දත්ත අධිකාරී | 01 | 09 |
| | | ජල විද්‍යා ක්ෂේත්‍ර අධිකාරී | 01 | 10 |
| | | ඉංජිනේරු ද්‍රව්‍ය අධිකාරී | 01 | 11 |
| | | ජල ශක්ති අධිකාරී | 01 | 12 |
| | | සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂණ අධිකාරී | 01 | 13 |
| | | ඉඩම් පරිහරණ අධිකාරී | 03 | 14 |
| | | ප්‍රධාන සැලසුම් කාර්යාල සහකාර | 01 | 15 |

(අ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2021.09.15** දින වේ.

| අනු. අංකය | දෙපාර්තමේන්තුව | තනතුරු | සුදුසුකම් |
|---|---|---|---|
| 04 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | නියෝජ්‍ය/සහකාර වන සංරක්ෂක (වන කළමනාකරණ) | ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ විශේෂ පන්තියේ වන පාලකවරයෙකු වීම. |
| | | නියෝජ්‍ය/සහකාර වන සංරක්ෂක (අධ්‍යාපන) | |
| | | නියෝජ්‍ය/සහකාර වන සංරක්ෂක (පර්යේෂණ) | |
| 05 | වාරි මාර්ග දෙපාර්තමේන්තුව | සහකාර පස් රසඥ | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පස් සමීක්ෂක තනතුරේ හෝ පර්යේෂණ සහකාර (සාමාන්‍ය) තනතුරේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හෝ I වන ශ්‍රේණියේ වසර (10) දහයකට වැඩි සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම. |
| | | ජල විද්‍යා දත්ත අධිකාරී | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ජල විද්‍යා සහකාර තනතුරේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හෝ I වන ශ්‍රේණියේ වසර (10) දහයකට වැඩි සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම. |

| අනු. අංකය | දෙපාර්තමේන්තුව | තනතුරු | සුදුසුකම් |
|---|---|---|---|
| | | ජල විද්‍යා ක්ෂේත්‍ර අධිකාරී | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාර තනතුරේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හෝ I වන ශ්‍රේණියේ වසර (10) දහයකට වැඩි සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම. |
| | | ඉංජිනේරු ද්‍රව්‍ය අධිකාරී | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ඉංජිනේරු ද්‍රව්‍ය අංශයේ පර්යේෂණ සහකාර තනතුරේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හෝ I වන ශ්‍රේණියේ වසර (10) දහයකට වැඩි සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම. |
| | | ජල ශක්ති අධිකාරී | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ජල ශක්ති අංශයේ පර්යේෂණ සහකාර තනතුරේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හෝ I වන ශ්‍රේණියේ වසර (10) දහයකට වැඩි සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම. |
| | | සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂණ අධිකාරී | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂණ තනතුරේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හෝ I වන ශ්‍රේණියේ වසර (10) දහයකට වැඩි සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම. |
| | | ඉඩම් පරිහරණ අධිකාරී | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පාංශු ප්‍රස්තාරක තනතුරේ හෝ පස් සමීක්ෂක තනතුරේ හෝ පර්යේෂණ සහකාර (සාමාන්‍ය) තනතුරේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියකු වීම හෝ 1වන ශ්‍රේණියේ වසර (10) දහයකට වැඩි සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම. |
| | | ප්‍රධාන සැලසුම් කාර්යාල සහකාර | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී තනතුරේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හෝ I වන ශ්‍රේණියේ වසර (10) දහයකට වැඩි සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම. |

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2021 අගෝස්තු මස 06 වැනි දින.

08-343

## අධ්‍යාපන අමාත්‍යාංශය

### සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය (ඉංග්‍රීසි විෂය සහිතව) සහ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත් ගුරුවරු විශ්ව විද්‍යාලවලට ඇතුළත් කිරීම - 2020/2021 අධ්‍යයන වර්ෂය

2020/2021 අධ්‍යයන වර්ෂ තුළ පහත සඳහන් පාඨමාලා හැදෑරීම පිණිස ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලවලට ඇතුළත් කර ගැනීම සඳහා සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය (ඉංග්‍රීසි විෂය සහිතව) සහ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත් රජයේ හෝ රජය අනුමත කරන ලද පෞද්ගලික පාසල්වල සේවය කරන ගුරුවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(i) කලා උපාධි පාඨමාලාව (ඉංග්‍රීසි විෂය සහිත)

(ii) විද්‍යාවේදී උපාධි පාඨමාලාව (ජෛවීය විද්‍යා, භෞතීය විද්‍යා හෝ ව්‍යවහාරික විද්‍යා පාඨමාලා)

02. ඉල්ලුම්කරුවන් මේ සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුයි.

(i) කලා පාඨමාලාව සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන ගුරුවරුන් 2016 වර්ෂයේ හෝ ඊට පසු වර්ෂයකදී පැවැත්වූ සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය (ඉංග්‍රීසි විෂය සහිතව) සමත්ව තිබිය යුතුය.

(ii) ජෛවීය විද්‍යා, භෞතීය විද්‍යා හෝ ව්‍යවහාරික විද්‍යා යන පාඨමාලා සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන ගුරුවරුන් 2016 වර්ෂයේ හෝ ඊටපසු පැවැත්වූ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත්ව තිබිය යුතුය.

(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ගුරුවරයෙකු වශයෙන් අවුරුදු 05ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය. අදළ ගුරු පත්වීම ස්ථිර කර තිබිය යුතුය.

(iv) දැනටමත් ගුරු අභ්‍යාස විද්‍යාලයක, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක, විශ්ව විද්‍යාලයක හෝ ජාතික අධ්‍යාපන ආයතනයේ පාඨමාලා හැදෑරීම සඳහා ලියාපදිංචි වී නොසිටිය යුතුය.

(v) යම් විශ්වවිද්‍යාලයක පවත්නා ජෛවීය විද්‍යා , භෞතීය විද්‍යා හෝ ව්‍යවහාරික විද්‍යා පාඨමාලාවක් සම්බන්ධයෙන් වූ විට, අදාළ පාඨමාලාවට සුදුසුකම් ලැබීම පිණිස අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී හෝ විද්‍යාවේදී (බාහිර ) උපාධි පළමු පරීක්ෂණයේදී හෝ අදාළ විශ්ව විද්‍යාලය විසින් පූර්ව අවශ්‍යතාවක් ලෙස දක්වනු ලබන විෂයයන් සඳහා සාමාර්ථ ලබා තිබිය යුතුය;

(vi) මෙම පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔවුනට අධ්‍යයන නිවාඩු ලබා දිය යුතු බැවින් එසේ අධ්‍යයන නිවාඩු හිමිකම් ඇති ගුරුවරුන් පමණක් මේ සඳහා අයදුම් කළ යුතුය.

03. මෙම ප්‍රවේශය යටතේ සිසුන් තෝරා ගනු ලබනුයේ සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණයේදී (ඉංග්‍රීසි විෂය සහිතව) හෝ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණයේදී ලබා ගත් මුළු ලකුණු අදාළ විෂයට ලබාගත් ලකුණු සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පවත්වන සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු පදනම් කරගෙනය.

04. වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ගැනීමට ඇති හිමිකම් පිළිබඳ සම්මුඛ පරීක්ෂණයේදී විමසා බලනු ලැබේ.

05. උපාධි ලබා ගැනීමෙන් අනතුරුව උපාධි ගුරු පත්වීම් ලබාදීම පිළිබඳ වගකීමට මෙම අමාත්‍යාංශය බැඳී නැත.

06. රජය අනුමත කරන පෞද්ගලික පාසල්වල සේවය කරන ගුරුවරුන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත්වල එම පාසලේ විදුහල්පති / කළමනාකරු විසින් අදාළ ගුරුවරිය / ගුරුවරයා සඳහා අධ්‍යයන නිවාඩු අනුමත කළ හැකි / නොහැකි බව ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතුය.

07. රජයේ ගුරුවරුන්ගේ අයදුම්පත් විදුහල්පති , කලාප භාර අධ්‍යාපන අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින්ද , රජය අනුමත කරන ලද පෞද්ගලික පාසල්වල ගුරුවරුන්ගේ අයදුම්පත් අදාළ විදුහල්පති / කළමනාකරු විසින්ද සහතික කළ යුතුය.

08. සෑම අයදුම්පතක් ම මෙහි සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට පිටපත් දෙකකින් (02) යුතුව 2021.09.03 දිනට පෙර ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය,''ඉසුරුපාය'', බත්තරමුල්ල ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලවලට ඇතුළත්වීම සඳහා අයදුම්පත් 2020/ 2021 (ගුරුභවතුන් සඳහා)" යනුවෙන් සඳහන් කළ යුතුය.

අයදුම්පත්‍රය අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ (WWW. moe.gov.lk) විශේෂ දැන්වීම් තීරයේ පළ කර ඇත.

මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

| |
|---|
| |

***අධ්‍යාපන අමාත්‍යාංශය***

*සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය ඉංග්‍රීසි විෂය සහිතව හෝ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත් ගුරුවරුන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කිරීම*
*2020/2021 අධ්‍යයන වර්ෂය*

1. (i) මුලකුරු සමග නම :—————.
   (ii) සම්පූර්ණ නම :—————.

2. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

3. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.

4. (i) තනතුර :—————. (ii) ශ්‍රේණිය :—————.

5. ලිපිනය :
   (i) රාජකාරී :—————.
   (ii) පෞද්ගලික :—————.

6. දුරකතන අංකය (i) ස්ථාවර :—————. (ii) ජංගම :—————.

7. විද්‍යුත් ලිපිනය (E-mail) :—————.

8. වර්තමාන සේවා ස්ථානය :
   (i) පාසල :—————.
   (ii) කලාපය :—————.
   (iii) දිස්ත්‍රික්කය :—————.
   (vi) පළාත :—————.

9. (i) මුල් පත්වීම් දිනය :—————.
   (ii) ස්ථිරත්වය ලද දිනය :—————.
   (iii) සේවා කාලය (මුල් පත්වීමේ සිට අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)
   වර්ෂ :—————. මාස :—————. දින :—————.

10. ගුරුවරයෙකු වශයෙන් ලියාපදිංචි අංකය :—————.

11. (i) උපන් දිනය
    වර්ෂය :—————. මාසය :—————. දිනය :—————.
    (ii) වයස (අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)
    වර්ෂ :—————. මාස :—————. දින :—————.

12. සුදුසුකම් ලබන විභාගය පිළිබඳ විස්තර (විශ්වවිද්‍යාලය මගින් නිකුත් කරන ලද ප්‍රතිඵල ලේඛනයේ සහතික කරන ලද පිටපතක් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුයි.)
    (i) විභාගය :—————.
    (ii) විශ්වවිද්‍යාලය :—————.
    (iii) ප්‍රතිඵල :—————.

| | *විෂයය* | *සමත්වූ වර්ෂය* | *ලකුණු* | *ශ්‍රේණිය* |
|---|---|---|---|---|
| 1. | | | | |
| 2. | | | | |
| 3. | | | | |
| 4. | | | | |
| 5. | | | | |

13. හැදෑරීමට අපේක්ෂිත උපාධි පාඨමාලාව සහ විෂයයන් ා
    (i) උපාධි පාඨමාලාවේ නම :————.
    (ii) විෂයයන් (1) ————————.
    (2) ————————.
    (3) ————————.

14. මෙම ප්‍රවේශය යටතේ ඔබව තෝරා ගතහොත් ඇතුළත්වීමට අපේක්ෂා කරන විශ්වවිද්‍යාලවල නම් ඔබගේ කැමැත්තේ අනුපිළිවෙලට සඳහන් කරන්න.
    (1) ————————. (3) ————————.
    (2) ————————. (4) ————————.

15. ඔබ ගුරු අභ්‍යාස විද්‍යාලයක/අධ්‍යාපන පීඨයක/විශ්වවිද්‍යාලයක හෝ ජාතික අධ්‍යාපන ආයතනයේ වෙනත් පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී සිටීද?

    එසේ ලියාපදිංචි වී ඇත්නම් ඒ පිළිබඳ විස්තර ා
    ..........................................................................................
    ..........................................................................................
    ..........................................................................................
    ..........................................................................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

........................ හිමි/මයා/මිය/මෙනවිය ............ දින සිට ............ ලෙස (තනතුර/ශ්‍රේණිය) ............... විද්‍යාලයේ සේවය කරන බවත් ඔහුට/ඇයට පෙර මාසයේ වැටුප ගෙවන ලද්දේ මෙම පාසලෙන් බවත්, යතෝක්ථ අධ්‍යයන පාඨමාලාව හැදෑරීම සඳහා ඔහු/ඇය නිදහස් කළ හැකි/නොහැකි බවත් සහතික කරමි.

අයදුම්කරුට/අයදුම්කාරියට අවශ්‍ය අධ්‍යයන නිවාඩු ලබාදීම නිර්දේශ කරමි/නොකරමි. (අධ්‍යයන නිවාඩු අනුමත නොකරන්නේ නම් හේතු දක්වන්න)

..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................

නිර්දේශ කරමි/නොකරමි.

————,
විදුහල්පති.
(අත්සන හා නිලමුද්‍රාව).

දිනය :————.
ලිපිනය :————.

නිර්දේශ කරමි/නොකරමි.

————,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ.
(අත්සන හා නිලමුද්‍රාව)

දිනය :————.
ලිපිනය :————.

නිර්දේශ කරමි/නොකරමි.

දිනය :————.
ලිපිනය :————.

————,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ.
(අත්සන හා නිලමුද්‍රාව)

08-352

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.